**බණ්ඩාරවෙල මහා නගර සභාව - 2021**

---------------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 වියාචනය කළ මතය

බණ්ඩාරවෙල මහා නගර සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් පිළිබඳ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මහා නගර සභා ආඥා පනතේ (252 වන අධිකාරය) 219 වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මහා නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි. මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

### 1.2 වියාචනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වියාචනය කළ මතයක් පළ කරනු ලැබේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මහා නගර සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව මහා නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය(මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා

ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මහා නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- අදාළ ලිඛිත නීතියකට හෝ මහා නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මහා නගර සභාව ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මහා නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සේවක ණය උප ලේඛනය අනුව ශේෂය රු.40,465,071 ක් වුවද,එය මූල්‍ය තත්ත්ව පිළිබඳ ප්‍රකාශනයේ රු.39,162,625 ක් ලෙස දක්වා තිබූ බැවින් රු.1,302,446 කින් අඩුවෙන් දක්වා තිබුණි. | ස්ථානමාරුවී ගිය හා වැඩ තහනම් කළ ඇතැම් සේවකයින්ගේ ණය ශේෂයන් මූල්‍ය ප්‍රකාශන වලට ඇතුළත් කිරීමට නොහැකි වූ බව සඳහන් කර ඇත. | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ වරිපනම් බදු ශේෂය රු.13,879,382 ක් වුවද එය මූල්‍ය මෙහෙයුම් පිළිබඳ ප්‍රකාශනයේ රු.11,664,133 ලෙස දක්වා තිබීමෙන් රු.2,215,249 ක් වැඩියෙන් ගිණුම්ගත කිරීම හේතුවෙන් ජංගම වත්කම් හා සමුච්චිත අරමුදල එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | රු.13,879,382 ක ශේෂය නිවැරදි බව සඳහන් කර ඇත. | |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ පොදු ලෙජරයේ ආරම්භක ශේෂ සටහන් කිරීමේදී වටිනාකම රු.60,832,925 ක හිඟ හිටි ආදායම් ශේෂ 34 ක් ගිණුම්ගත කර නොතිබීම හේතුවෙන් මූල්‍ය තත්ත්ව පිළිබඳ ප්‍රකාශනයේ ජංගම වත්කම් අඩුවෙන් හා එම ප්‍රමාණයෙන් සමුච්චිත අරමුදල වැඩියෙන් දක්වා තිබුණි. | පරීක්ෂා කර බලා 2022 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව සඳහන් කර ඇත. | |
| (ඈ) | සමාලෝචිත වර්ෂයට අදාළව ඉකුත් වර්ෂ වලදි ලැබී තිබුණු ආදායම් ගිණුම් 14 ක් වෙනුවෙන් වූ ලැබුණු රු.153,224 ක් සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම්ගත නොකිරීම හේතුවෙන් එම ප්‍රමාණයෙන් මෙහෙයුම් ආදායම අඩුවෙන්ද, ජංගම බැරකම් වැඩියෙන්ද දක්වා තිබුණි. | | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අත්තිකාරම් ලේඛනය අනුව නොපියවූ අත්තිකාරම් ශේෂය රු.10,793,807 ක් වුවද,මූල්‍ය තත්ත්ව පිළිබඳ ප්‍රකාශනයේ ලැබිය යුතු දැ හි අත්තිකාරම් ලෙස වටිනාකම ලෙස රු.30,978,836 ක් දක්වා තිබීමෙන් රු.20,185,029 ක් වැඩියෙන්ද එම ප්‍රමාණයෙන් සමුච්චිත අරමුදල අඩුවෙන්ද දක්වා තිබුණි. | රු.10,793,809 ක මුදල සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කර්මාන්ත ඇතුළු නොපියවූ අත්තිකාරම් බවත්, රු.30,978,836 ක මුදල නොපියවූ අත්තිකාරම් බවත් සඳහන් කර ඇත. | |
| (ඊ) | සමාලෝචිත වර්ෂයේදී සංවර්ධන ව්‍යාපෘති සඳහා ජංගම ගිණුමෙන් ලබාගන්නා ලද රු.10,000,000 ක මුදලට අදාළව ද්විත්ව සටහන් වෙනුවට අත්තිකාරම් ගිණුමට පමණක් හර කර තිබියදී එක ගිණුම් තුලනය වී තිබීම මතභේදාත්මක වීම. | ජ'නල් සටහන් මඟින් නිවැරදි කිරීමට කටයුතු කරන බව සඳහන් කර ඇත. | |
| (උ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට උප ලේඛන අනුව හිඟහිටි වෙනත් ආදායම් ශේෂය රු.23,510,627 ක් වුවද, එය රු.124,569,537 ක් ලෙස රු.101,058,910 කින් වැඩියෙන් දක්වා තිබීමෙන් මූල්‍ය තත්ත්ව පිළිබඳ ප්‍රකාශනයේ ලැබිය යුතු දැ සහ සමුච්චිත අරමුදල එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | පරීක්ෂා කර බලා 2022 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව සඳහන් කර ඇත. | |
| (ඌ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ හිටි උසාවි දඩ ආදායම රු.889,270 ක් වුවද,එය රු.465,213 ක් ලෙස රු.424,057 ක් අඩුවෙන් දක්වා තිබීමෙන් මූල්‍ය තත්ත්ව පිළිබඳ ප්‍රකාශනයේ ජංගම වත්කම් සහ සමුච්චිත අරමුදල එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | උසාවි දඩ ආදායම් ලේඛන ප්‍රමාදවී ලැබෙන බැවින් 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදි කරන බව සඳහන් කර ඇත. | |
| (එ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ හිටි මුද්දර ගාස්තු ආදායම රු.10,229,445 ක් වුවද, එය රු.3,832,117 ක් ලෙස රු.6,397,328 කින් අඩුවෙන් දක්වා තිබීමෙන් මූල්‍ය තත්ත්ව පිළිබඳ ප්‍රකාශනයේ ජංගම වත්කම් සහ සමුච්චිත අරමුදල එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරන අවස්ථාවේදි ලැබුණු උපලේඛන අනුව ශේෂයන් ඇතුළත් කර ඇති බව සඳහන් කර ඇත. | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුය. |
| (ඒ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මහා නගර සභාව විසින් රාජ්‍ය බැංකුවක ඉතිරි කිරීමේ ගිණුමක තැන්පත් කර තිබුණු රු.2,641,286 ක මුදල පිළිබඳව මූල්‍ය තත්ත්ව පිළිබඳ ප්‍රකාශනයේ ජංගම වත්කම් යටතේ දක්වා නොතිබීමෙන් එම ප්‍රමාණයෙන් ජංගම වත්කම් අඩුවෙන් දක්වා තිබුණි. | ප්‍රමාද දෝෂයකින් ගිණුම් ශේෂය මූල්‍ය ප්‍රකාශන වලට ඇතුළත් කිරීමට නොහැකි වූ බව හා 2022 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදි නිවැරදි | |

| | | |
|---|---|---|
| (ඕ) සමාලෝචිත වර්ෂයේ රු.1,808,345 ක කර්මාන්ත ණය හිමි ශේෂ 07 ක් ණය හිමියෝ ලෙසට හඳුනා නොගැනීම හේතුවෙන්, මෙහෙයුම් ආදායම වැඩියෙන්ද ජංගම බැරකම් අඩුවෙන්ද ගිණුම්ගත කර තිබුණි. | කරන බව සඳහන් කර ඇත. | |

**1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන ගිණුම් විෂයයන් 02 කට අදාළ ශේෂයන් හා ඒවාට අදාළ උපයෝගි ලේඛන වල දැක්වෙන ශේෂයන් අතර රු.77,072,525 ක වෙනසක් නිරීක්ෂණය විය. | අදාළ ගැලපීම් සිදුකර නිවැරදි ශේෂයන් ඉදිරිපත් කරන බව සඳහන් කර ඇත. | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරනලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.39,020,666 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 19,567,571 ක් විය.

**2.2 ආදායම් පරිපාලනය**

**2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2019 වර්ෂයේ සිට පැවත එන රථවාහන 15 ක හිඟහිටි බලපත්‍ර ගාස්තු රු.479,800 ක් සහ ජංගම ලොරි රථ 25 ක ගාස්තු රු.272,500 ක් සමාලෝචිත වර්ෂයේදීද අය කරගෙන නොතිබුණි.<br>(ආ) 2016 වර්ෂයේ සිට පැවත එන පෞද්ගලික වරිපනම් බදු ඒකක 9235 කට අදාළ හිඟහිටි වරිපනම් බදු රු.11,664,133 ක් සමාලෝචිත වර්ෂයේදීද අය කරගෙන නොතිබුණි. | අයකර ගැනීමට කටයුතු කරන බව සඳහන් කර ඇත. | හිඟ ආදායම් අයකරගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2016 වර්ෂයේ සිට පැවත එන හිඟහිටි සතිපොළ ගාස්තු රු.1,166,094 ක් සහ හිඟහිටි පොදු වැසිකිළි ගාස්තු රු.1,846,047 ක් සමාලෝචිත වර්ෂයේදීද අය කරගෙන නොතිබුණි. | අයකර ගැනීමට කටයුතු කරන බව සඳහන් කර ඇත. | හිඟ ආදායම් අයකරගත යුතුය. |
| (ඈ) | 2012 වර්ෂයේ සිට පැවත එන කඩ කාමර 427 ක හිඟහිටි කඩ කුලී රු.6,187,235 ක් සහ කඩ කාමර 37 ක හිඟහිටි වාර්ෂික බදු කුලී රු.9,162,596 ක් සමාලෝචිත වර්ෂයේදීද අය කරගෙන නොතිබුණි. | | |
| (ඉ) | 2012 සිට 2021 දක්වා වූ වසර 07 ක කාලය තුලදී මහා නගර සභාව වාර්ෂිකව බදු දී තිබුණු කුකුල් මස්,ගව මස්, එළු මස් , මාළු කඩ සහ පොළ ආදී දේපල 29 ක් සඳහා අවසාන නිවේදන නිකුත් කර ඇතත්, සමාලෝචිත වර්ෂයේ සැප්තැම්බර් 30 දිනට රු.10,281,728 ක හිඟ බදු කුලී අය කරගෙන නොතිබුණි. | හිඟ බදු කුලී සම්බන්ධයෙන් අවසන් නිවේදන නිකුත් කර ඇති බව හා ඉතිරිය අය කර ගැනීමට කටයුතු කරන බව සඳහන් කර ඇත. | හිඟ බදු කුලී අය කරගත යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

මහා නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

### 3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2004 වර්ෂයේදී නාගරික සංවර්ධන සහ අඩු ආදායම් නිවාස ව්‍යාපෘතිය යටතේ නාගරික සංවර්ධන අධිකාරිය විසින් කොන්ත්‍රාත් ආයතනයක් සමඟ එළඹ තිබූ ගිවිසුමකට මහා නගර සභා බල සීමාවේ පිහිටි මලාපවහන සහ වැසි ජල කාණු පද්ධතියක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය සඳහා රු.4,403,970 ක ණය මුදලක් දේශීය ණය සහ සංවර්ධන අරමුදලට ගෙවන ලෙසට දන්වා මහා නගර සභාවට ව්‍යාපෘතිය නිම කර පවරා දී තිබුණි. ව්‍යාපෘතියෙන් විධිමත්ව ජලය බැස යාමක් සිදුනොවීම හේතුවෙන් මහා නගර සභාව විසින් දේශීය ණය සහ සංවර්ධන අරමුදලට ගෙවිය යුතු ණය වාරික හා පොලිය ගෙවීම නතර කළ යුතු බවට 2006 නොවැම්බර් 24 දින මහා සභා රැස්වීමේදි තීරණය කර තිබුණි. | මලාපවහන කාණු පද්ධතිය නිසි පරිදි ක්‍රියාත්මක නොවන හෙයින් ණය මුදල් ගෙවීමට කටයුතු නොකරන බවත්, ඒ පිළිබඳ දේශීය ණය හා සංවර්ධන අරමුදල දැනුවත් කිරීමට පියවර ගනිමින් සිටින බව සඳහන් කර ඇත. | ව්‍යාපෘතිය අධීක්ෂණයට පත් කළ කමිටු නිර්දේශය අනුව ක්‍රියාකළ යුතු අතර, ණය හා පොලී ගෙවිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| | සභාව විසින් 2021 දෙසැම්බර් 31 දිනට දේශීය ණය සහ සංවර්ධන අරමුදලට ගෙවිය යුතු හිඟ ණය වාරික සහ පොලිය රු.7,164,366 ක් වී තිබුණි. | | |
| (ආ) | 2015 වර්ෂයේදී රාජ්‍ය පරිපාලන,පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය විසින් රු. 6,390,000 කට කැබ් රථයක් මහා නගර සභාවට ලබාදී තිබුණි. එම වර්ෂයේදීම කැබ් රථය අනතුරකට ලක් වී තිබු අතර, අලුත්වැඩියා කර ගැනීම සඳහා දේශීය නියෝජිත ආයතනයට බාර දීමෙන් පසුව රු.6,354,490 ක අලුත්වැඩියා ඇස්තමේන්තුවක් ඉදිරිපත් කර තිබුණි. ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ අනුමත ගරාජයකින් අලුත්වැඩියාව සිදු කර ගැනීමටත් එම අලුත්වැඩියාවෙන් පසුව ගෙවීමට ඇති මුදල රක්ෂණ සංස්ථාව මගින් නිරවුල් කර ගැනීමටත් කමිටු අනුමැතිය ලැබී තිබුණද, වසර 06 ක් ගතවී ඇතත් මෙම කැබ් රථයට සිදු වූ හානිය සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 105(2) ප්‍රකාරව අලාභ හානිය සඳහා වගකිව යුතු නිලධාරීන් නිශ්චය කර ගැනීමට හා අයකර ගතයුතු උපරිම අගය තීරණය කර නොතිබුණි. අනතුර සිදුවී වසර 06 ක් ගතවී ඇතත් 2021 ඔක්තෝබර් 12 දින දක්වා රක්ෂණ වන්දි අයකර ගෙන නොතිබු අතර, රක්ෂණ සමාගම විසින් රු.2,200,000 ක් පමණක් ගෙවීමට කැමැත්ත දක්වා තිබුණු බැවින්, අදාළ වාහනය අනතුරෙන් බණ්ඩාරවෙල මහා නගර සභාවට රු.4,184,491 ක අලාභයක් දැරීමට සිදුවී තිබුණි. | කැබ් රථය අලුත්වැඩියා කිරීම සඳහා පෞද්ගලික ගරාජයකට භාරදී ඇති බවත්,රථයේ අනතුර සම්බන්ධයෙන් මු.රෙ 104 ප්‍රකාරව ප්‍රාරම්භක වාර්තාව පළාත් පාලන අමාත්‍යාංශයට යවා ඇති බවත් අවසන් වාර්තාව මේ දක්වා ලැබී නොමැති බවත් සඳහන් කර ඇත. | රක්ෂණ වන්දි අය කරගෙන මු.රෙ 105(2) ප්‍රකාරව අලාභ හානි සඳහා වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගත යුතුය. |

**3.2 ප්‍රසම්පාදන කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| බණ්ඩාරවෙල මහා නගර සභාවට සතු තොග හා සිල්ලර පොළෙහි 2020 වර්ෂයට ගාස්තු අයකිරීමේ අයිතිය බදුදීම සඳහා ලංසුකරුවන් කැඳවීමේදී 2019 වර්ෂයේ අවසාන දින 10 තෙක් ප්‍රමාද කර පුවත්පත් දැන්වීම් පලකර තිබූ අතර ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.2.2 ඡේදයේ දැක්වෙන විධිවිධානවලට පටහැනිව ලංසු කැඳවීම දින 06 කට සීමා කර තිබුණි. එයින් දින 03 කට පසු ලංසු පෝරම නිකුත් කිරීම මඟින් ලංසුකරුවන් සපුරාලිය යුතු බවට නියම කරන ලද විශේෂ කොන්දේසි සපුරා ගැනීමට ප්‍රමාණවත් කාලයක් නොතිබීම සහ ඒ සඳහා සාධාරණ කාලයක් ලබාදෙන ලෙස ඉල්ලීම් කර තිබුණද ඒ සඳහා ප්‍රසම්පාදන කමිටුවේ අවධානය යොමු කර නොතිබුණි. ලංසුකරුවන්ට ඔවුන්ගේ වත්කම් හිමිකම් සහතිකයක් ඉදිරිපත් කිරීමට නොහැකි වීම වැනි ඉතාම සුළු අඩුපාඩුවක් මත ඉහළම ලංසු ඉදිරිපත් කළ ලංසුකරුන්ගේ ලංසු ප්‍රතික්ෂේප කිරීම හා අඩුම ලංසු ඉදිරිපත් කළ ලංසුකරුවන්ගේ ලංසු පිළිගැනීමෙන් බණ්ඩාරවෙල මහා නගර සභාවට රු.8,290,000 ක මූල්‍යමය පාඩුවක් දැරීමට සිදුවී තිබුණි. | තොග හා සිල්ලර පොළ දීර්ඝ කාලයක් එකම පුද්ගලයකු බදු ගැනීම වැලැක්වීම සඳහා කොන්දේසි දැඩිකර පුවත්පත් දැන්වීම් පළ කර ටෙන්ඩරුකරුවකු තෝරාගෙන මහා නගර සභා ආඥා පනතේ 229 (2) වගන්තිය අනුව ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලබාගෙන ඇති බව සඳහන් කර ඇත. | විධිමත්ව ටෙන්ඩර් ක්‍රියාවලිය අනුගමනය කර දේපළ බදුදිය යුතුය. |

**3.3 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මහා නගර සභාවක වාර්ෂික මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර මහා නගර සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමේ වගකීම ඇත්තේ එහි ගණකාධිකාරී වෙත වුවද ගණකාධිකාරී විසින් 2021 වර්ෂයේ බණ්ඩාරවෙල මහා නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම විමර්ශන නිලධාරීන් දෙදෙනෙකුට පවරා එම කාර්ය සඳහා සභා අරමුදලින් රු.61,109 ක් ගෙවීම් කර තිබුණි. ඒ අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දැනුම හා පළපුරුද්ද නොමැති නිලධාරියෙකු කොන්ත්‍රාත් පදනම මත ගණකාධිකාරී තනතුර සඳහා බඳවා ගැනීම මෙන්ම ඔහු | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරන නිලධාරි අසනීප නිවාඩු මත සිටි බැවින්, සභාවේ වෙනත් නිලධාරියෙකු ඒ සඳහා යොදා ගත නොහැකි වූ බවත් සඳහන් කර ඇත. | ගණකාධිකාරිවරයෙකු සභාවේ සේවයේ යෙදී සිටියදි විමර්ශන නිලධාරින් මඟින් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිගත නොහැක. |

වෙත වැටුප් හා දීමනා ගෙවීම් කර තිබීම පිළිගත නොහැකි තත්ත්වයක් වීම.

**4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීමේ ප්‍රමාදය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මුදල් අමාත්‍යාංශ චක්‍රලේඛ අංක PFD/RED/REG/02/CC/01/2021 හා 2021 මැයි 10 දිනැති චක්‍රලේඛය අනුව මහා නගර සභාවේ සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර 2022 වර්ෂයේ පෙබරවාරි 28 දිනට ප්‍රථම විගණකාධිපතිට ඉදිරිපත් කළ යුතු වුවද, මහා නගර සභාව විසින් මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කර තිබුණේ 2022 මාර්තු 30 දින බැවින්, විගණකාධිපති වෙත මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරිමේදී මසක ප්‍රමාදයක් සිදුවී තිබුණි. | අදාළ චක්‍රලේඛය සභාවට අනුගත කර ගන්නා බව සඳහන් කර ඇත. | සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2022 පෙබරවාරි 28 දිනට ප්‍රථම විගණකාධිපතිට ඉදිරිපත් කළයුතුය. |